# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1255/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 05/10/2023 පැය 1540

# මාධ්‍ය නිවේදනය

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්යය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2023.10.05 වන අද දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තිරුක්කෝවිල් පොලිස් වසමේ උඩුම්බිකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක්වූ උඩුම්බිකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2023.10.04 වන දින දහවල් කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ කාලිපුල්ලවත්ත ප්‍රදේශයේදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදු කල වැටලීමකදී හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 426 ක් සන්තකයේ ලබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක්වූ ධර්මාරාම පාර, දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2023.10.04 වන දින රාත්‍රී කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ මාලිගාවත්ත ප්‍රදේශයේදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදු කල වැටලීමකදී හෙරොයින් ග්‍රෑම් 11 ක් සන්තකයේ ලබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක්වූ මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. වන අලියෙකු පහරදී පුද්ගලයකු මිය යාම - තණමල්විල පොලිස් වසම.**

2023.10.05 වන අද දින උදෑසන කාලයේ දී තණමල්විල පොලිස් වසමේ බටුවැව ප්‍රදේශයේ ඉඩමක වගා කටයුතු කරමින් සිටි පුද්ගලයකුට වන අලියෙකු පහර දීම හේතුවෙන් තුවාල ලබා බරපතල තත්ත්වයේ පසු වූ තුවාලකරු ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත.

**මරණකරු  වයස අවුරුදු 64 ක් වූ නිකවැව, සූරියආර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මේ සම්බන්ධව තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. පස් කන්දකට යට වී පුද්ගලයකු මිය යාම - ගාල්ල පොලිස් වසම.**

2023.10.05 වන අද දින උදෑසන කාලයේ දී ගාල්ල පොලිස් වසමේ වැලිවත්ත, ගාල්ල ප්‍රදේශයේ නිවසක් මතට පස් කන්දක් කඩා වැටී, එම පස් කන්දට යටවී පුද්ගලයකු තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇති බවට ගාල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු  වයස අවුරුදු 78 ක් වූ ගාල්ල, වැලිවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පවතින අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් මරණකරු පදිංචි නිවස අසල ඇති පස් කන්දක් නිවස මතට කඩා වැටීම හේතුවෙන් එයට යට වීමෙන් මෙම පුද්ගලයා තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති බවට සිදු කල විමර්ශනවලදී අනාවරණය වී ඇත. මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**